අංක 94/02

මගේ අංකය - අසේ / 8 / 1
අධ්‍යාපන හා සංස්කෘතික
කටයුතු අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

1994 ජනවාරි මස 10 දින.

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

## II වන ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරීන් ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ - V වන පන්තියට පත් කිරීම

1978.01.01 වන දිනට පෙර II ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරීන් 1982.04.21 වන දින සිට ක්‍රියාත්මක වන සේ ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ - V වන පන්තියට පත් කිරීමට 1993.11.24 වන දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත. මෙම තනතුරු දනට අනුමත සේවක සංඛ්‍යාවෙන් පරිබාහිර ඒවා සේ සලකනු ලැබේ.

02. මෙම පත් කිරීමේදී පහත සඳහන් සීමාවන්ට අදළව ක්‍රියා කළ යුතු වේ.

2.1 1982 අප්‍රියෙල් 21 වන දින සිට 1992 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලයට හිඟ වැටුප් කිසිවක් නොගෙවා, එම කාලය උපලේඛනගත තනතුරකට අයත් සේවා කාලයක් ලෙස පමණක් සැලකීම;

2.2 II වන ශ්‍රේණියේ විශේෂ තනතුර යටතේ ලබාගෙන ඇති, වැටුප් සහ අනෙකුත් අයිතිවාසිකම් අහිමි නොකිරීම;

2.3 II වැනි ශ්‍රේණියේ විශේෂ තනතුර යටතේ විශ්‍රාම ලබා තිබේ නම්, 1982 අප්‍රියෙල් 21 වැනි දින සිට, අධ්‍යාපන සේවයේ - V වැනි පන්තියට නියමිත වැටුප ගණන් බලා විශ්‍රාම ලැබූ දිනට නියමිත වැටුප මත, විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම;

2.4 "ශ්‍රී ලංකා අධ්‍යාපන සේවය" වෙනුවට 1985 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන "ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය" ට බලපැවැත්වෙන ව්‍යවස්ථාවට අනුකූලව, මෙම නිලධාරීන් අදළ පන්තියට අන්තර්ග්‍රහණය කිරීම හා ඊට ලැබිය යුතු නව වැටුප් පරිමාණයන් හි පිහිටුවා, 1993 ජනවාරි 01 වැනි දින සිට එම වැටුප් ගෙවීම.

03. ශ්‍රී ලංකා අධ්‍යාපන සේවයේ - V වන පන්තියට පත් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පහත දක්වේ.

3.1 මේ සඳහා අ.සේ. 8/1-"ඒ" ආකෘති පත්‍රය භාවිතා කළ යුතු වේ.

3.2 <u>අ.සේ. 8/1-"ඒ" ආකෘති පත්‍රයේ අංක 01 සිට 08 දක්වා විස්තර</u>

II වන ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරියා විසින් විධිමත් පරිදි සම්පූර්ණ කොට යට දක්වෙන ලිපිවල පිටපත් ද විධිමත් පරිදි සම්පූර්ණ කොට දිනය යොදා අත්සන් කළ යුතු වේ.

එහි අංක 07හි සඳහන් පරිදි II වන ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරියකු ලෙස පත්කරනු ලැබූ ලිපියේ ඡායාස්ථිති පිටපතක් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ/ ඔහු / ඇය දනට සේවය කරන ආයතන ප්‍රධානියා විසින් සහතික කොට මෙම ආකෘති පත්‍රයට යා කළයුතු වේ. අංක 08 හි දක්වෙන පරිදි

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබූ ලිපියේ ඡායා පිටපත නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ ඔහු/ඇය දනට සේවය කරන ආයතන ප්‍රධානියා විසින් හෝ සහතික කොට මෙම අයදුම්පතට යා කළයුතු වේ.

3.3 <u>ආකෘති පත්‍රයේ අංක 09 හි නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය</u>

II වන ශ්‍රේණියේ විශේෂ තනතුරුධාරීන් අදළ අයදුම්කරු දැනට සේවය කරන කොට්ඨාශයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් හෝ වෙනත් ආයතනයක සේවය කරනු ලබන්නේ නම්, එම ආයතන ප්‍රධානියා විසින් හෝ මෙම අයදුම්පතෙහි නිර්දේශය සඳහන් කොට නිල මුද්‍රාව තබා අත්සන් කළ යුතු වේ. කිසියම් කෙනෙකුගේ අයදුම්පතක් නිර්දේශ කරනු නොලබන්නේ නම් එයට විශේෂ හේතු දක්විය යුතු වේ.

උදහරණ වශයෙන් කිසියම් අයදුම්කරුවෙකු විනය ක්‍රියා මාර්ගයක් නිසා වැඩ තහනම්කර ලක් වී සිටී නම්, ඒ බව සඳහන් කළ යුතුය. එසේම විශ්‍රාමිකයකු, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12වන ඡේදය යටතේ විශ්‍රාම ගොස් ඇත්නම් ඒ බව සඳහන් කළ යුතුය. මේ ආදී වශයෙන් විශේෂ හේතු ඇතොත් කරුණාකර ඒවා සඳහන් කරන්න.

3.4 <u>පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය</u> -

මෙම ආකෘතියේ 10වන අංකය යටතේ ඇති කොටස සම්පූර්ණ කොට අදළ නිර්දේශය ද පැහැදිලිව සඳහන් කොට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පෞද්ගලිකව අත්සන් කළ යුතු වේ. එසේම එහි නිල මුද්‍රාව තැබිය යුතු වේ. එසේ කොට ගෙන මතු සඳහන් ලිපිනයට ලැබෙන්න සලස්වන්න. මෙම සියලුම අයදුම්පත් ලැබෙන තෙක් නොසිට ඒවා ඉදිරිපත්වන ආකාරයට මා වෙත එවීමට කටයුතු කරන්න.

<u>ලිපිනය</u>

ලේකම්,
අධ්‍යාපන සේවා ශාඛාව,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

සියලුම අයදුම්පත් 1994 ජනවාරි මස 31වන දිනට පෙර එවීමට කටයුතු කළ යුතු බව දන්වමි. එසේම දනට විශ්‍රාම ගොස් ඇති අයට ද මෙය අදළ වන බැවින්, මේ පිළිබඳව අදළ නිලධාරීන්ගේ දනගැනීමට සලස්වන මෙන් දන්වමි. කරුණාකර මෙම චක්‍රලේඛය ලැබුණු බව දන්වන්න.

එන්. වී. කේ. කේ. වේරගොඩ
ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත්,

1. ලේකම්, අධ්‍යාපන සේවා මණ්ඩලය
2. සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් වෙත.
3. ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
4. අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යංශයේ සියලුම අංශ ප්‍රධානීන්
5. විගණකාධිපති